**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය**
**මෙල්බර්න් ඕස්ට්‍රේලියාව**

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் கொன்சலர் அதிபதி அலுவலகம்
மெல்போர்ன் அவுஸ்திரேலியா

**THE CONSULATE GENERAL OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**MELBOURNE AUSTRALIA**

*Telephone:* (03) 9290 4200, (03) 9290 4201
*Fax:* (03) 9867 4873
*Email:* mail@slcgmel.org
*Website:* www.slcgmel.org

Suite 536, No.1, Queens Road,
Melbourne, VIC 3004, AUSTRALIA

**ශ්‍රී ලංකාවේ 70වෙනි නිදහස් සමරු උළෙලේ දී VCE විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සිසුන් පිළිගැනීමට ලක් කිරීම**

වික්ටෝරියාවේ කොන්සල් ජනරාල් කාර්යාලය 2017 VCE විභාගයෙන් පහත දැක්වෙන අන්දමින් සාමාර්ථයන් ලැබූ සිසුන් හට අදාල ප්‍රදානයන් සඳහා අයදුම් කරන මෙන් ඉල්ලා සිටී .

1. ATAR ලකුණු සංඛ්‍යාව 95 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, VCE විභාගයෙන් උපරිම සමත්කම් දැක්වූ සිසුන් 10 දෙනා හට පිරිනැමෙන ප්‍රදානයන් සඳහා
2. සිංහල භාෂාව සඳහා ලකුණු සංඛ්‍යාව 40 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, සිංහල භාෂාව සඳහා උපරිම සමත්කම් දැක්වූ සිසුවාට පිරිනැමෙන ප්‍රදානය සඳහා, සහ
3. දෙමළ භාෂාව සඳහා ලකුණු සංඛ්‍යාව 40 ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇතිනම්, දෙමළ භාෂාව සඳහා උපරිම සමත්කම් දැක්වූ සිසුවාට පිරිනැමෙන ප්‍රදානය සඳහා

2018 පෙබරවාරි 4 වෙනිදා 979-985 Nepean Hwy, Moorabbin, Vic 3189 හි 'Kingston City Hall' හිදී පැවැත්වෙන ශ්‍රී ලංකාවේ 70වෙනි නිදහස් සමරු උළෙලේදී මෙම ප්‍රදානයන් පිරිනැමෙනු ඇත.

අයදුම්පත් හෝ වැඩි විස්තර **(3) 92904210** හෝ **0415200196** ඇමතීමෙන් හෝ, mail@slcgmel.org වෙත විද්‍යුත් ලිපියක් යොමු කිරීමෙන් ලබා ගතහැක.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2018 ජනවාරි 12 වෙනි සිකුරාදා ප.ව. 5 ට පෙර** කොන්සල් ජනරාල් කාර්යාලය වෙත ලැබීමට සලස්වන්න.

කොන්සල් ජනරාල් කාර්යාලය
මෙල්බර්න්
24/10/2017

**Consulate General of the Democratic Socialist Republic of Sri Lanka**
Suites 536,542 and 544, 1 Queens Road, Melbourne, Victoria 3004
Tel: (03) 9290 4200, (03) 9290 4201 Fax: (03) 9867 4873 E-mail: mail@slcgmel.org

**Nomination for Top 10 VCE High Achievers 2017 Awards**

The Consulate General of the Democratic Socialist Republic of Sri Lanka in Victoria requests nominations of those who have achieved ATAR score of 95 or above from the 2017 VCE examination to be considered for the top 10 VCE High Achievers Awards.

The awards will be presented at the Commemoration of the 70th Anniversary of the Independence of Sri Lanka to be held on the **4th of February 2018** at 'Kingston City Hall', 979-985 Nepean Hwy, Moorabbin, VIC 3128.

To be considered for the awards, a duly completed nomination form with a certified copy of ATAR score sheet should be sent by post, fax or email to the Consulate General by **5.00pm Friday 12, January 2018.**

**Selection Criteria:**

1. Only the students with Sri Lankan origin are eligible to apply.
2. To be considered for the awards, the Students must have an ATAR score of 95 or above from the VCE examination held in 2017.
3. Top ten nominees with maximum ATAR scores among the nominations received as per the above guidelines will be selected for the awards after verification of the scores.
4. Decision of the selection panel will be final and conclusive.

**Nomination Form**

| | | | | |
|---|---|---|---|---|
| Full Name of the nominee (Mr. / Ms.) | | | | |
| Address | | | | |
| | Suburb | | Post Code | |
| Telephone Number | Home | | Mobile | |
| Email Address | | | | |
| School | | | | |
| ATAR Score | | | | |
| Parent/Guardian | Name | | | |
| | Address | | | |
| | Suburb | | Post Code | |
| | Contact Numbers | | | |
| Certified Copy of ATAR Score sheet attached? | ☐ YES | ☐ NO | | |

.................................... Signature of the Nominee Date:................................

.................................... Signature of the Parent/Guardian Date:................................

**32 පිටෙන්**

තියෙන්නෙ"

"ඒක තමයි මහත්තයා මං මේ කියන්නෙ.. මහත්තයලා වගේ අවංක අය මැදිහත් වෙලා මේ සමාජය වෙනස් කරන්න ඕනෙ.. මේ මිනස්සුන්ට මග පෙන්වන්න ඕනෙ.." ලොකු හාමුදුරුවෝ කනප්පුව මත වූ වටාපතින් පවන් සළා ගනිති. "හරිම ගිරිස්මයක්නෙ දරුවො මේක" උන්වහන්සේ කියන්නේ ස්නේහාට ය. ඉන්පසු නැවත ඔහුගේ බැල්ම නවතින්නේ ඉසුර හමුවේ ය. "ඉතින් මහත්තයෝ.."

"මේක නොදන්න කමම නෙවෙයි අපේ හාමුදුරුවනේ.. මේ මිනිස්සුන්ට තමන් අදහන දේශපාලකයා මොන පාදඩ කම කළත් පේන්නෙ නැහැ.. පෙනුනත් පිලිගන්නෙ නැහැ.. මේක නොදන්න කමට එහා ගිය වෙනින් මොකක්දෝ මානසිකත්වයක්.."

"මං පිලිගන්නව ඉසුර මහත්තයා... අපේම සමහර හාමුදුරුවොත් හොරු රැක ගන්න බුද්ධාගමත් වෙනස් කරගෙන දඟලන හැටි දැක්කම අපටත් ඇතිවෙන්නෙ මහා කළකිරීමක් තමයි.. මේ විකෘතිය හදාගන්නෙ කොහොමද කියලා හොයන්න ඕනෙ මහත්තයා.. මොකක් හරි මගක් ඇති මේක වෙනස් කරන්න.. අන්න ඒ පාර හොයා ගන්න ඕනෙ"

ලොකු හාමුදුරුවන් කියන්නේ ඇත්ත ය. ඉසුර ඒ බව දනියි. එනමුත් කල්පනා කළ යුතු දේ බොහෝ ඇති බව ඔහුට සිතෙයි.

"ඇහුණා නේද හාමුදුරුවො කියපු දේ?" ස්නේහා වැලි මිදුල හරහා මහ ගේට්ටුව වෙත ඇවිද එමින් සිටියදී ඇසුවා ය.

ඉසුර කිසිවක් නොකියා සිනාසුණෝ ය. ඔහු කල්පනාවක සිටින්නේ යයි ස්නේහාට සිතුණි. වැලි බිම පුරා බෝ කොළ විසිරී ඇත. කොයි තරම් අතුගෑවත් නිරන්තරව වැටෙන බෝ කොළ නිසා බිම හැඩි වීම නවත්වන්නට නොහැකි ය. බෝ ගසේ කොල සෙළැවෙන සිලි සිලිය මෙතැනටත් හොඳින් ඇසෙයි.

"එක කල්පනා කරලා බලන්න වටින කතාවක්" ස්නේහා නැවත කීවා ය.

"දේශපාලනේට එන්න මගේ බලාපොරොත්තුවක් නැහැ ස්නේහා" ඉසුර බොහෝ වේලාවකට පසුව කීවේ ය.

"ඇයි..?"

"මේ කුණු ගොඩේ වැටෙන්න ආස නැහැ.. හොඳයි කියන්න පුලුවන් එක දේශපාලකයෙක්වත් අද ඉන්නවද..? එකම එකෙක් වත් නෑ.. මුන් රොත්ත මැද්දට පැනල මඩ නා ගන්න මට ඕනෙ කමක් නැහැ"

"මේ කුණුගොඩ සුද්ද කරන්න පුලුවන් අය තමයි දැන් දේශපාලනේට යන්න ඕන... හොරුන්ටම ඉඩ දීල හිටියොත් රටට මොකද වෙන්නෙ..? අපි අතපැය බැඳගෙන ඉඳලා හරියන්නෙ නෑ අයියෙ.. මිනිස්සු බූරුවො නෙවෙයි කියන එක මේ හොරුන්ටයි හොරු පස්සෙ දුවන මෝඩ රැළටයි පෙන්නලා දෙන්න ඕනෙ... ඒ වැඩේට අයියලා වගේ අය ඉස-"සරහට යන්න ඕනෙ.." ස්නේහා කියද්දී ඔවුහු පන්සලේ මහ ගේට්ටුවෙන් ගුරු පාරට අවතීර්ණ වෙමින් සිටියහ. ඔහු සිටින්නේ තනිවම සිනාසෙමින් බව ඇයට පෙනෙයි.

"ඇයි හිනාවෙන්නෙ?"

"කොළඹ ගියාට පස්සෙ ස්නේහා පණ්ඩිත වෙලා... ඉස්සර ඔහොම නැහැ.. ඉස්සර ස්නේහා ලෝකෙ රටේ වෙන දේ තියා අල්ලපු වැටේ වෙන දේවත් දැනගෙන හිටියෙ නැහැ"

"ඒකටද හිනාවුණේ..?"

"හිනාවුණේ නැහැ.. හිනා ගියා.. උපහාසෙකට අපහාසෙකට නෙවෙයි.. සතුටට"

"හිනාවෙලා හරියන්නෙ නැහැ අයියෙ.. ගමේ මිනිස්සුත් ඔයාට කැමති එකේ මේක ගැන ටිකක් හිතන්න.. ඔයාට දිග ගමනක් යන්න පුලුවන්.. අවංක මිනිස්සුන්ට කරන්න පුලුවන් දෙවල් තියෙනවා.. වරද නිවැරදි කරගන්න හැකියාව තියෙන අය නිශ්ෂබ්දව ඉන්න එකත් ලොකු වරදක්.. හිතන්න පොඩ්ඩක්"

"මං නොහිතනවා නෙවෙයි නංගි.. හිතනවා.. නොයෙක් දේ හිතෙනවා.. මං එහෙම ගමනක් යනවා නම් මේ තියෙන එක දේශපාලන පක්ෂයකටවත් සම්බන්ධ නොවී ඒ ගමන යන්න තමයි මගේ කැමැත්ත.. ඒකට ඉඩක් තියේ නම් මට ආයෙ පාරක් මේ ගැන හිතල බලන්න පුලුවන්.. අපි බලමු.."

"බලන්න දෙයක් නෑ.. ක්‍රියාත්මක වෙන්නයි තියෙන්නෙ"

"මම ක්‍රියාත්මක වෙන්නම්..." ඔහු හැරී ඇගේ මුහුණ බැලුවේ ය. "..ඔයා දිගටම ගම ඉන්නවා නම්"

**මතු සම්බන්ධයි**